# Family Tax Benefit Part B
# (පවුල් ආදායම් බදු ප්‍රතිලාභ ආ කොටස)



## Family Tax Benefit Part B—Sinhalese

හුදෙකලා මාපිය පවුල් සඳහා සහ එක් ප්‍රධාන ආදායමක් සහිත එහෙත් එක් මාපියෙකු තම දරුවන් බලාහදා ගැනීම සඳහා ගෙදර නැවතීමේ හෝ ගෙවන රැකියාවෙන් කාලය තුලනය කරයි නම් අමතර සහාය ලබා දෙයි.

පවුල් ආදායම් බදු ප්‍රතිලාභ ආ කොටස තක්සේරු කරනු ලබන්නේ ප්‍රධාන සහ ද්විතියික(අඩු) ආදායම් උපයන්නන්ගෙ ආදායම් තක්සේරු අගය පදනම් කොටගෙනය. හුදෙකලා දෙමව්පියන් සෑම විටම උපරිම තක්සේරු අගයෙහි පිහිටා ගෙවීම් ලබති.

ඔබේ ගෙවීම් දෙසතියකට වරක් ලබා ගැනීමට තීරණය කරන්නේ නම් ඔබේ පවුලේ ආදායම ඉතිරි මුදල් වර්ෂය සඳහා තක්සේරු කිරීමට සිදුවනු ඇත. ඔබේ Family Tax Benefit Part B වාර්ෂිකව එකවර ගෙවනු ලබන මුදලක් ලෙස ලබා ගැනීමටද ඔබට තිරණය කළ හැකිය. **වාර්ෂිකව හිමිකම් කීමේදී ඔබේ වැඩිපුර මුදල් ගෙවීමේ අවදානම අඩු කරනු ඇත.**

## ලබාගත හැක්කේ කාහටද?

ඔබ අනිවාර්යයෙන්:

- හුදෙකලා මාපිය පවුලක මාපිය ආදායම ප්‍රධාන ආදායම් උපයන්නාගෙ ආදායම් පරීක්ෂාව සපුරාලිය යුතුය; හෝ
- දෙමාපිය පවුලක දෙමාපියන් දෙදෙනාගේම ආදායම් ප්‍රධාන ආදායම් උපයන්නාගෙ ආදායම් පරීක්ෂා සපුරාලිය යුතුය; සහ
- යැපෙන දරුවකුට තම කාලයෙන් සියයt 35 ක් හෝ ඊට වැඩි කාලයක් රැකවරණ සැපයීම; **සහ**
- පවුල් උපකාර සේවා සඳහා අවශ්‍යවන ඕස්ට්‍රේලියානු වාසික අවශ්‍යතා සපුරාලීම.
- ඔබගේ කාලයෙන් සියයට 35 සහ 65ක් අතර කාලයක් ඔබගේ දරුවාගේ රැකවරණය වෙනුවෙන් ගත කරයි නම්, ඔබ පවුල් ආදායම් බදු ප්‍රතිලාභ ආ කොටස මගින් යම් ප්‍රමාණයක් ලැබීමට අයිතිවාසිකම් තිබිය හැක.

ඔබ ඔබේ දරුවාගේ රැකවරණය බෙදා ගනී නම් ඔබ යටතේ දරුවා රැකෙන කාලය සඳහා Family Tax Benefit Part B ලැබීමට ඔබට හිමිකම් කිව හැකිය.

## කොපමණ ප්‍රමාණයක් මා හට ලබා ගත හැකිද?

සියළුම තක්සේරු අගයන් 1/7/2008 දිනයට වලංගුව පවතී.

**Family Tax Benefit Part B හි උපරිම තක්සේරු අගයන් පහත දැක්වේ:**

| බාලම දරුවාගේ වයස | දෙසතියකට වරක් | වාර්ෂිකව (අතිරේකයද ඇතුළුව) |
|---|---|---|
| අවුරුදු 5න් පහළ | $128.80 | $3,693.80 |
| අවැරුදු 5-15 (හෝ අවුරුදු 16-18 පූර්ණ කාලීන ශිෂ්‍ය ශිෂ්‍යාවක් නම්) | $89.74 | $2,675.45 |

## ආදායම් පරීක්ෂා යනු මොනවාද?

වාර්ෂික $150,000 ක් හෝ ඊට වඩා අඩු ප්‍රධාන ආදායම් උපයන්නාගේ ආදායම් පරීක්ෂාව හුදෙකලා මාපිය පවුල් සහ දෙමාපිය පවුල් යන දෙකටම අයත් වේ. හුදෙකලා මාපිය පවුල්හි ආදායම ප්‍රධාන ආදායම් උපයන්නාගේ ආදායම් සීමාවට වඩා අඩු නම් සෑම අවස්ථාවකම උපරිම තක්සේරු අගයෙහි පිහිටා Family Tax Benefit Part B ලබා ගනී.

දෙමාපිය පවුලක ප්‍රධාන ආදායම් උපයන්නාගේ වාර්ෂික ආදායම $150,000 හෝ ඊට වඩා අඩු නම් අඩු ආදායම් ලබන්නාගේ ආදායම සැලකිල්ලට ගනු ලැබේ. අඩු ආදායම් ලබන්නා වාර්ෂිකව $4,526 උපයද්දීත් උපරිම Family Tax Benefit Part B තක්සේරු අගය ලබා ගත හැක. අඩු ආදායම ලබන්නාගේ ආදායම $4,526ට වැඩි නම් උපයන්නාවු සෑම අමතර ඩොරයකටම සත 20 බැගින් ගෙවීම අඩුවේ.

We speak your language ✆ 13 1202

www.familyassist.gov.au

Australian Government
Family Assistance Office

අඩු ආදායම් උපයන්නාගේ ආදායම පහත පරිදි වේ නම්, සුදුසුකම් ලත් දෙමාපියන් යම් Family Tax Benefit Part B ප්‍රමාණයක් ලබනු ඇත:

- බාලම දරුවා අවුරුදු 5ට අඩු නම් වාර්ෂිකව $22,995 හෝ
- බාලම දරුවා අවු 5 සහ 18 අතර වයසේ වේ නම් වාර්ෂිකව $17,904

## Family Tax Benefit Part B Supplement (පවුල් ආදායම් බදු ප්‍රතිලාභ ආ කොටස අතිරේකය) යනු කුමක්ද?

මෙය පවුලකට Family Tax Benefit Part B හි $335.80 ක වාර්ෂික තක්සේරු අගයේ වැඩි වීමකි. මෙය ඔබත් ඔබේ සහකරු/කාරියත් ආදායම් වාර්තාව ගොනු කළ විට මුදල් වසර අවසානයේ ගෙවනු ලැබේ. ඔබත් ඔබේ සහකරු/කාරිය ආදායම් බදු වාර්තා ගොනු කිරීමට අනවශ්‍ය නම් Family Assistance Office (පවුල් උපකාරක කාර්යාලය අමතන්න). Family Tax Benefit Part B Supplement (පවුල් ආදායම් බදු ප්‍රතිලාභ ආ කොටස අතිරේකය) පවුල් සඳහා වැඩිපුර ගෙවීම් කොට ඇති අවස්ථාවන් හිදී එකී නොගෙවන ලද ගෙවීම් හිලව් කිරීම සඳහා උපකාරී කර ගනු ලැබේ.

## නැවත රැකියාව වෙත යන දෙමාපියන්

2005 ජුලි 1 දා සිට දරුවකු ඉපදීමෙන් පසු ආපසු රැකියාවට යන දෙමාපියනට රැකියාවට යාමට පෙරාතු මුදල් වසර සඳහා Family Tax Benefit Part B සඳහා අයිතිවාසිකම් තිබිය හැක. ඔබ හෝ ඔබේ සහකරු/කාරිය දරුවෙකු ලැබීමෙන් පසු නැවත රැකියාවෙහි යෙදීම ආරම්භ කොට ඇත්නම් එය Family Assistance Office වෙත දැනුම් දිය යුතුය.

## වැඩිපුර විස්තර සඳහා:

- සිංහල භාෂාවෙන් තොරතුරු ලබා ගැනීම සඳහා අංක **13 1202** මගින් සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව 8.00 සහ ප.ව 5.00 (EST) Family Assistance Office (පවුල් උපකාරක කාර්යාලය) අමතන්න.
- **www.familyassist.gov.au** වෙබ් අඩවියට පිවිසෙන්න.
- ඔබට ආසන්නයේම ඇති Medicare Australia කාර්යාලයන් Centrelink පාරිභෝගික සේවා මධ්‍යස්ථානයන් සහ ආදායම් බදු කාර්යාලයන්හි පිහිටා ඇති Family Assistance Office වෙත පිය නගන්න.